3 වන පිටෙන්



ටැංකි අවුරුදු පනහකට වඩා කාලයක් මළකඩ කමින් තිබුණා. ආණ්ඩුවේ විතරක් නෙමෙයි, තෙල් සංස්ථාවේ, වරාය අධිකාරියේ මහජන මුදලින් වැටුප් ගත් රජයේ නිලධාරීන්, සේවකයන්, වෘත්තීය සමිති මොනවද කළේ?

සියල්ල රජයෙන් නොමිළේ දිය යුතුයි කියන අදහස ලංකාවේ ස්ථාපිත වුණේ මාක්ස්වාදී බලවේගවල බලපෑමෙන්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩු යටතේයි. උදාහරණයක් ලෙස, උසස් අධ්‍යාපනයත් නොමිළේ දීලා, එයින් බිහි වන කුසලතා රහිත උපාධිධාරීන්ට රැකියාත් රජයෙන් ම දිය යුතුයි කියා තමයි ලංකාවේ මිනිසුන් හිතන්නේ.

තව මෙවැනි පිරිසක් තමයි ගොවියෝ. ඔවුන් ආහාර නිෂ්පාදනයේ යෙදෙන නිසා උපාධිධාරී රජයේ සේවකයන්ට වඩා වැදගත් පිරිසක් බවට කිසිදු තර්කයක් නැහැ. හැබැයි, වතුර, පොහොර, බිත්තර වී ආදිය නිකම් දීලා, අස්වැන්නත් රජයෙන් ම වැඩි මිළට මිළ දී ගත යුතුයි කියායි ලංකාවේ ගොවියන් සාමාන්‍යයෙන් සිතන්නෙ.

හැබැයි, මේ රජය කියන්නේ මොකක්ද කියා රජයේ සේවකයන්ගෙන් ඇහුවොත් ඔවුන් හැසිරෙන්නේ තමන් රජය නෙමෙයි වගේ. ඔවුන් ද රජය බනිනවා. ආණ්ඩුවට බනිනවා. උදාහරණයක් විදියට රජයේ ආයතනවල වෘත්තීය සමිති නායකයන් අරගෙන බලන්න. ඒවායේ හැමදාම වගේ නායකත්වයේ ඉන්නේ එකම පිරිස. මේ අය වැඩ කරන්නේ ම නැහැ. රජයෙන් පඩි ගනිමින්, රජයට ම බනිමින්, කඩාකප්පල් ක්‍රියා සංවිධානය කරන ආකාරය ගැන කල්පනා කරමින් කාලකණ්ණි වෙනවා.


## Alpha Academy 2017

Glen Waverley Classes

Grade 8 , 9 - Mathematics
Grade 8 , 9 - Science
Grade 8 ,9 - English
VCE Chemistry 1 , 2
VCE Biology 1 , 2
Other subjects - Upon request

- All students will be tested before enrolment , placed accordingly in the groups
- Unit Tests for all subjects
- VCE , SAC preparation guidance
- Ongoing updates for parents
- Multiple classes during week , enabling catch-up classes

**To request an application, please text student name, Class and school to**
**0457908918**


ලංකාවේ තත්වය වකුරු කරන තවත් පිරිසක් තමයි මාධ්‍යකරුවෝ. ලංකාවේ මාධ්‍ය වැඩියි. එච්චර මාධ්‍ය පරිහරණය කරන්නට මිනිසුන්ට වෙලාවත් නැහැ. ඒ නිසා හොර රේටිං දමාගෙන, දැන්වීම් හිගාගෙන මේ කරන කුණු රස්සාව වෙනුවෙන් ඕනෑම බාල දෙයක් විකුණන්නට ඔවුන්ට සිදු වෙලා තිබෙනවා. ඒ නිසා මේ පිරිසගේ මුළු කාලයම යෙදවෙන්නේ නැති අවුල් ඇති කිරීමටයි. ප්‍රතිරූප ගොඩනගා ගැනීම වෙනුවෙන් මේ පාන්වලට හොඳි වෙන්න සූදානම් දේශපාලකයන්, වෘත්තීය සමිති නායකයන්, වෙනත් සිවිල් සමාජ පොරවල් හා කලාරිටවල් හෙවත් කලාකරුවන් වැනි අයත් ඉන්නවා.

වැඩ කරන මිනිසුන් සවසට රූපවාහිනිය ඉදිරිපිට වාඩි වුණාම මේ පොල් බූරුවන් ඇවිත් ඒ මිනිසුන්ගේ ඔලු කුරුවල් කරනවා. විනයක් නැතිකම බෝ වෙන්නෙ එහෙමයි.

මේ දවස්වල ලංකාවේ රජය ආර්ථික ප්‍රතිසංස්කරණ සිදු කරන්නට දරණ උත්සාහය සම්බන්ධයෙන් දේශපාලකයන්ගෙ, වෘත්තීය සමිතිකාරයන්ගෙ, මාධ්‍යකාරයන්ගෙ හා වෙනත් සිවිල් සමාජ පොරවල චර්යාවත් ඔය වගේ ම තමයි.

ඒ වෙනුවෙන් නිර්මානය කරපු භාෂා ප්‍රයෝග තිබෙනවා. නිදහස් අරක, නිදහස් මේක, විකි□ම, ලාභ ලැබීම, වෙළඳපොළකරනය, නව ලිබරල්වාදය වැනි සංකල්ප කිසිදු ගැඹුරකින් තොරව මිනිසුන්ගේ ඔලූ මත දමා ගසන ආකාරය දැකිය හැකියි. වෙළඳපොළ වැරදිද, සාධාරණ ලාභය කියන එකේ වරද මොකක්ද, නිදහස් ය කියන ඒවට කවුරුද ගෙවන්නෙ, නවලිබරල්වාදය කියල දෙයක් තියෙනව ද වගේ ප්‍රශ්න නැගුවාම මේ වචන භාවිතා කරන අයට ඒවාට පිළිතුරු නැහැ.

මේ සියල්ල පවතින්නෙ විනයක් නැති සමස්තයක් ඇතුළෙ. දේශපාලකයන්ටත් විනයක් නැති බව ඇත්ත. හැබැයි පුරවැසියා කියන්නෙ දේශපාලකයාට වඩා ඉදිරියෙන් සිටිය යුතු කෙනෙක් මේ සිරි ලංකාවෙ හැටියට.

## සන්නස Cartoon by PK





## රියැදුරන් අවශ්‍යයි

UBER වාහන පැදවීම සඳහා පළපුරුදු රියැදුරන් අවශ්‍යයි

නිකැළැල් රියැදුරු ඉතිහාසයක් ඇති අය විමසන්න

ටැක්සි බලපත්‍රය තිබීම අමතර සුදුසුකමකි

**විමසන්න**
**0422 671 826**